වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 25 වැනිදා බදාදා

දිනමිණ

# විද්‍යා

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ
අමාත්‍යාංශයේ නිල පුවත්පත





## ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රමෝපායීකරණය සඳහා වූ

# විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්මන්ත්‍රණය සාර්ථකයි

* ජනපතිතුමන් සම්මන්ත්‍රණයට එක්වෙයි
* විෂයානුබද්ධ ගැටලු රැසක් ජනපතිතුමන්ට ඉදිරිපත් කරයි
* විද්වතුන්ගේ හඬ අවදි කිරීමට කාලය එළැඹ ඇතැ' යි ජනපති පවසයි

**දුලිප් නයනප්‍රිය**

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී එම කාර්යයන් ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස සිදු කර ගැනීමට විද්‍යාඥයින්, තාක්ෂණවේදීන් සහ වෘත්තිකයින් සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දීමත්, ක්‍රමෝපායීකරණය හරහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් පිළිබඳ සාකච්ඡාමය සම්මන්ත්‍රණය බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී පැවැත්විණි. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ අදහසකට අනුව සංවිධානය කළ මේ සම්මන්ත්‍රණයේ තේමාව 'විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන ක්‍රමෝපායයන් සඳහා අදාළ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම යි.'

*03 වැනි පිටුවට...*

## නවෝත්පාදනයේ ශ්‍රී ලාංකීය ප්‍රවේශය

# සහසක් නිමැවුම් - 2017

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සංවිධානය කළ 'සහසක් නිමැවුම් - 2017' නව නිර්මාණ ප්‍රදර්ශනය සහ තරගාවලිය පසුගිය ද ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, උදය ආර්. සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් 6 වැනි වරටත් සංවිධාන කළ මේ ප්‍රදර්ශනය හා තරගාවලිය පාසල්, විවෘත, විශ්වවිද්‍යාල හා තෘතීයික අධ්‍යාපන ආයතන, වානිජකරණය කරන ලද නිර්මාණ වශයෙන් අංශ හතරක් යටතේ පැවැත්විණි. තරගාවලියේ මූලික වටයේ දී එනම්, පළාත් මට්ටමින් පැවති තරගවල දී ඇගයීමට ලක්වූ නිර්මාණ මේ ජාතික තරගයට ඉදිරිපත්කර තිබෙන අතර, ක්ෂේත්‍ර 14ක් ඔස්සේ නව නිර්මාණ 400ක් ප්‍රදර්ශනයට හා තරගයට විවෘත කර තිබිණි.

*03 වැනි පිටුවට...*

# ශ්‍රී ලංකාව හා ඉන්දියාව ඒකාබද්ධ පර්යේෂණවලට අත්සන් තබයි



ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අත්සන් තැබුණු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර සහයෝගීතා වැඩසටහන යටතේ, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා පාර්ශ්වයේ පර්යේෂකයන් විසින් ගිවිසුම් අත්සන් තැබීම පසුගියදා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී සිදු විය. ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවත් අතර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර සහයෝගීතා වැඩසටහන ක්‍රියාත්මක කරනු පිණිස එකගතා ගිවිසුමකට 2016 වර්ෂයේ අගෝස්තු මාසයේ දී ඉන්දියාවේ දී අත්සන් තබන ලදී .

*03 වැනි පිටුවට..*







# බහුකාර්ය සේවාවකට ඇප කැප වූ නව ව්‍යාපාරික මධ්‍යස්ථානයක්

ශ්‍රී ලංකාව වේගවත් සංවර්ධන මාවතකට අවතීර්ණ වී ඇති යුගයක රටේ අභිවෘද්ධිය සඳහා විශාල දායකත්වයක් ලබා දීමට කාර්මික තාක්ෂණ ආයතනය (ITI) පියවර ගෙන ඇත. **“යම් වැදගත් අරමුණක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ක්‍රියාව පමණක් නොව, ඒ සඳහා සිහින දැකිය යුතුය. සැලසුම් පමණක් ප්‍රමාණවත් නැත. විශ්වාසය ද තිබිය යුතුය.”** යන නෝබෙල් ත්‍යාගලාභී ඇනටෝල් ප්‍රාන්ක් නවකතාකරු විසින් කළ ප්‍රකාශයක් සත්‍යයක් කරමින් කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සංකල්පයක් මත ව්‍යාපාරික මධ්‍යස්ථානයක් (Business Centre) අප රටේ ස්ථාපිත කිරීමට අඩිතාලම් තැබිණි. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, රැකී රක්ෂා උත්පාදනය මෙන්ම ප්‍රාදේශීය ආර්ථික අසමතුලිතතා දුරලීම ද, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉහළ තලයකට ඔසවා තැබීම ද අපගේ ඒකායන අරමුණ යි.

මේ සඳහා අප සතු සම්පත් රාශියකි. එම සම්පත් හා අපගේ හැකියාවන් මගින් බහුකාර්ය සේවාවක් සැපයීමට ව්‍යාපාරික මධ්‍යස්ථානය (Business centre) හරහා හැකිවනු ඇත. ග්‍රාමීය සම්පත්වලට අගය එකතුකර නව නිෂ්පාදන හඳුන්වා දීමට ද හැකි වනු ඇත. නමුදු අවශ්‍ය තාක්ෂණික දැනුම, තත්ත්වය, වෙළෙඳපොළ ආදි ගැටලුවලට ව්‍යවසායකයන්ට බොහෝ විට මුහුණපෑමට සිදු වේ. එවන් අවස්ථාවල දී ඒවාට තනිව මුහුණ දෙන ව්‍යවසායකයාට ව්‍යාපාරයක් සාර්ථකව කරගැනීමට නොහැකි වීමෙන් අසාර්ථක වන අවස්ථා ද එමටය. අපගේ ව්‍යාපාරික මධ්‍යස්ථානය මගින් ඔවුන්ට අවශ්‍ය දැනුම ලබාදීම හා පුහුණුව සඳහා ඔවුන්ට අවශ්‍ය මග පෙන්වීම කළ හැකි වේ . ඒ අනුව වෙළෙඳපොළට අවශ්‍ය ආකාරයට තම භාණ්ඩ හා සේවා ලබාදීමට අප ව්‍යාපාරික මධ්‍යස්ථානය නව ව්‍යවසායකයන්ට විසල් අත්වැලක් වනු ඇත. අවශ්‍ය කරන සියලු සේවාවන් එක ම ස්ථානයකින් (onestop shop) ලබාදීමට මෙහිදී බලාපොරොත්තු වන අතර, ජාත්‍යන්තර මට්ටමට ගෙන යා හැකි ඉල්ලුමක් සහිත නිෂ්පාදන හඳුන්වා දීමටත් ඒ සඳහා අවශ්‍ය තත්ත්ව සහතික ලබාදීම, පුහුණුව සහ තම නිෂ්පාදන සඳහා අවශ්‍ය අනෙකුත් සේවාවන් සම්බන්ධීකරණය කිරීමට ද නියමිතය. ඒ සඳහා ඇපකැප වූ දක්ෂ, සුහදශීලි කාර්ය මණ්ඩලයක් අප සතුව ඇත. ඔවුන්ගේ එම දැනුම හා සේවා ලබාගනිමින්, වෙළෙඳපොළ ජය ගැනීමටත්, ඔවුන් දකින සිහින සැබෑ කිරීමට මේ මධ්‍යස්ථානය මහගු පිටුවහලක් වනු ඇත.

දේශීය අමුද්‍රව්‍යයන්ට අගය එකතු කරමින් නව තාක්ෂණයන් හඳුන්වා දීමට, තම නිෂ්පාදනවල තත්ත්වය උසස් කරලීමට අවශ්‍ය කරන උපදෙස් වෙළෙඳපොළ සබඳතා ආදි කටයුතු මෙමගින් සිදුකෙරෙනු ඇත. මේ බහුකාර්ය සේවාවන් අතරින් ඉතාමත් විශේෂිත වනුයේ ව්‍යාපාරිකයන්ට හෝ ව්‍යවසායකයන්ට අවශ්‍ය සියලු තොරතුරු එක ම ස්ථානයකින් ලබා ගැනීමට ඇති හැකියාවයි. මේ සේවා ලබාදීමට අනෙකුත් රජයේ ආයතන, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සමග අත්වැල් බැඳගනු ඇත. මේ සේවාවන් කඩිනමින් හා පහසුවෙන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වෙසෙන ග්‍රාමීය ජනතාවට ලබා ගත හැකි පරිදි වෙබ් අඩවියක් හරහා ලබාදීමට බලාපොරොත්තු වේ. රාජ්‍ය හා පෞද්ගලික අංශ එක්ව වැඩ කිරීමට ඇති අවකාශ වැය කරමින් අවශ්‍යතා සපුරාලීමට රාජ්‍ය සේවාවට හැකි වනු ඇත.

මේ වෙළෙඳ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූල්‍ය සහාය, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සැපයෙන අතර, ‘ග්‍රාම ශක්ති’ ජනතා ව්‍යාපාරය සඳහා තාක්ෂණික සහකරු වශයෙන් ITI කටයුතු කරන බව ද දන්වා සිටින්නේ ඉමහත් සතුටිනි.

**මනෝරි විජේමාන්න**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා**
**අලෙවි හා ප්‍රවර්ධන අංශය**

# ශ්‍රී ලාංකීය කුරුඳු නිස්සාරණයෙන් දියවැඩියාව, කොලෙස්ටරෝල් පරීක්ෂණ සාර්ථකව ඉදිරියට

ශ්‍රී ලාංකීය කුරුඳු (Ceylon Cinnomon) අතීතයේ සිට මිනිස් රුධිරයේ ග්ලූකෝස් මට්ටම සහ කොලෙස්ටරෝල් මට්ටම පාලනය කිරීමට ඖෂධයක් ලෙස යොදාගෙන ඇත. නමුත් ශ්‍රී ලාංකීය කුරුඳු මගින් හෝ එහි නිස්සාරකයක් මගින් මිනිස් රුධිරයේ ග්ලූකෝස් මට්ටම හා කොලෙස්ටරෝල් මට්ටම අඩු කරන බවට සායනික පරීක්ෂණ මගින් මෙතෙක් තහවුරු කර නැත.

ශ්‍රී ලාංකේය කුරුඳුවලට ආදේශකයක් ලෙස හා ලෝකයේ වැඩි වශයෙන් භාවිත වන (Cassia) නැමැති කුරුඳු විශේෂය මගින් මිනිස් රුධිරයේ ග්ලූකෝස් හා කොලෙස්ටරොල් මට්ටම පාලනය කළ හැකි බව සායනිකව තහවුරු කර ඇත. එනමුත් “cassia”වල ඉහළ ප්‍රතිශතයකින් (0.1 – 1.0%) පවතින “Coumarin” නම් අක්මාවට විෂදායක රසායනික සංඝටකය පැවතීම නිසා එහි පරිභෝජනය සීමා වී ඇත. ශ්‍රී ලාංකීය කුරුඳු හා එහි නිස්සාරකයේ “Coumarin” නම් විෂ රසායනික සංඝටකය ඉතාමත් අඩු ප්‍රතිශතයකින් (0.001%) පැවතීම නිසා ජාත්‍යන්තර වශයෙන් එහි වටිනාකම ඉහළ ගොස් ඇත. එබැවින් ශ්‍රී ලාංකීය කුරුඳු හා එහි නිස්සාරක මගින් මිනිස් රුධිරයේ ග්ලූකෝස් හා කොලෙස්ටරෝල් මට්ටම විධිමත් රසායනික පරීක්ෂණ මගින් තහවුරු කිරීමෙන් ලාංකීය කුරුඳුවලට අගය එකතු කිරීමක් ( Value Addition) හෝ ඉහළ මිලක් සහිත ශ්‍රී ලාංකීය කුරුඳු කැප්සියුලයක් (Ceylon Cinnamon Capsule) ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා හඳුන්වාදීම වටී. ITIහි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රියංග රණසිංහ මහතා ඇතුළු වෛද්‍ය කණ්ඩායමක ගේ මූලිකත්වයෙන් මීට වසර 06කට ඉහත දී ආරම්භක පියවරක් ලෙස පරීක්ෂණාගාර මීයන් යොදාගෙන ( Rat Trials) පරීක්ෂණ ආරම්භ කරන ලදී. එහි දී දියවැඩියාව ප්‍රේරණය කරන ලද සහ නිරෝගී මීයන්ට ශ්‍රී ලාංකීය කුරුඳු නිස්සාරණය ලබා දී රුධිරයේ ග්ලූකෝස් හා කොලෙස්ටරෝල් මට්ටම් පරීක්ෂා කරන ලදී.

එහි දී දියවැඩියාව ප්‍රේරණය කරන ලද මීයන්ගේ රුධිරයේ ග්ලූකෝස් හා කොලෙස්ටරෝල් මට්ටම සැලකිය යුතු ලෙස අඩු වූ බව නිරීක්ෂණය විය. එම නිරීක්ෂණ මුල් කරගෙන දෙවැනි පියවරක් ලෙස, නිරෝගී හා දියවැඩියාවෙන් පෙළෙන පුද්ගලයන් යොදාගෙන සායනික පරීක්ෂණ (Clinical Trials – Phase (I) ] Phase (II) ) මගින් ශ්‍රී ලාංකීය කුරුඳු නිස්සාරණය රුධිරයේ ග්ලූකෝස් හා කොලෙස්ටරෝල් මට්ටම් අඩු කිරීමට අවශ්‍ය පරීක්ෂණ සාර්ථක ලෙස ආරම්භ කර ඇත.

මේ ක්‍රියාවලියේ දී කාර්මික තාක්ෂණ ආයතනය ( ITI) මගින් ශ්‍රී ලාංකේය කුරුඳුවල සක්‍රීය සංඝටක (Active Ingridents) වන, Tannins & Procynidins යන සංඝටක ජලය යොදාගෙන ආසවනය කරනු ලැබේ. අනතුරුව එහි පවතින ජලය විශේෂ ක්‍රමයක් මගින් ඉවත් කර, සියුම් කුඩක් ( Fine Powder) ආකාරයෙන් පිළියෙළ කරයි. එම කුරුඳු නිස්සාරකය භාවිතයෙන් කුරුඳු කැප්සියුලයක් තනා ගනී.

මේ පිළිවෙළ කරගත් කුරුඳු කැප්සූල ආධාරයෙන් නිරෝගී පුද්ගලයන් 30 දෙනකුට මාස 03ක සිදු කරන ලද සායනික පරීක්ෂණ ( Clinical Trials - Phase (I) ) මගින් එම පුද්ගලයන්ගේ රුධිර ග්ලූකෝස් හා කොලස්ටරෝල් මට්ටම් සැලකිය යුතු ලෙස පහළ ගිය බවට වාර්තා වී ඇත. එසේම රුධිර පීඩනය ද නියමිත මට්ටමට පාලනය වී ඇත. ඊට අමතරව, මේ සායනික පරීක්ෂණ මගින් ශ්‍රී ලාංකීය කුරුඳු නිස්සාරකය ලබාදීම මගින් ශරීරයට කිසිදු අහිසි බලපෑමක් ඇති නොවන බවට ද තහවුරු වී ඇත. මේ සායනික පරීක්ෂණවල ඊළඟ පියවර ලෙස ( Clinical Trials - Phase ( II) ) දියවැඩියාවෙන් පෙළෙන රෝගීන් 210ක් යොදාගෙන මාස 04ක් තුළ පරීක්ෂණ කිරීමට පියවර ගෙන ඇත. මේ සායනික පරීක්ෂණ වලින් පසුව, ශ්‍රී ලාංකීය කුරුඳු නිස්සාරක කැප්සියුලය දියවැඩියාවෙන් හා අධික කොලෙස්ටරෝල් මට්ටමින් පෙළෙන පුද්ගලයන් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ. කොළඹ වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රියංග රණසිංහ, විශේෂඥ වෛද්‍ය ප්‍රසාද් කටුලන්ද හා ප්‍රියදර්ශන ගලප්පත්ති යන වෛද්‍ය කණ්ඩායම සායනික පර්යේෂණ මෙහෙයවයි.













**එච්.ඩී. වීරතුංග**
**පර්යේෂණ විද්‍යාඥ**
**කාර්මික තාක්ෂණ ආයතනය**





# රටේ තිරසර සංවර්ධනයට අමාත්‍යාංශයේ වගකීම ඉටුකරනවා

## —— සුසිල් ප්‍රේමජයන්ත - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය

තිරසර සංවර්ධන අරමුණු ජයගනිමින් ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම අවශ්‍ය බව අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා පවසයි. අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහ ජාතික විද්‍යා පදනමේ සම සංවිධානයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය මඟින් සංවිධාන කළ 4 වැනි බහු විෂයානුබද්ධ ප්‍රවේශය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ (iCMA – 2017 ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වෙමිනි.

සම්මන්ත්‍රණය පසුගියදා හික්කඩුව, හික්කා ට්‍රාන්ස් හෝටලයේ දී පැවැත්විණි."බහු විෂයානුබද්ධ පර්යේෂණ හරහා තිරසර සංවර්ධනය ළඟා කරගැනීම "යන්න මෙවර සමුළුවේ තේමාවයි.

මේ සම්මන්ත්‍රණය අධ්‍යාපනඥයන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන් සඳහා විෂය ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ විහිදී පැතිරී ඇති සිය දැනුම, අත්දැකීම්, පර්යේෂණයන් සහ ඒවායෙහි ප්‍රතිඵල එකිනෙකා අතර හුවමාරු කරගැනීමට අවකාශ සලසාදීමට සහාය වන වාර්ෂික විෂයානුබද්ධ සම්මන්ත්‍රණයකි.

වර්තමානයේ පුළුල් ක්ෂේත්‍ර ගණනාවක සිදු කෙරෙන හා සිදු කරන ලද පර්යේෂණයන් පිළිබඳ සාකච්ඡා කිරීම, විවාද කිරීම, අදහස් හුවමාරු කිරීම සහ පිළිගැනීම යනාදිය සඳහා පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නන්ට ඒ සඳහා අවකාශ සලසා දෙන වේදිකාවක් නිර්මාණය කිරීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය.

සම්මන්ත්‍රණයේ සමාරම්භක සැසියේ දී සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා අදහස් දක්වමින් මෙසේ පැවසීය.

" මේ සම්මන්ත්‍රණයේ තේමාව අප රටට මෙන්ම ලෝකයටම කාලීන වශයෙන් වැදගත් වෙනවා. මීට වසර දෙකකට පෙර එක්සත් ජාතීන්ගේ 70 වැනි මහ සමුළුවේ දී 2030 වන විට ලෝකය ජයගත යුතු තිරසර සංවර්ධන අරමුණු 17ක් සහ ඒ සඳහා වන ඉලක්ක 169 ක් ද හඳුන්වා දී තිබෙනවා.

එම අරමුණුවල අංක එකට 'දිළිඳුකම පිටුදැකීම හඳුන්වා දී තිබෙනවා. එසේම, වත්මන් රජය මේ වර්ෂය 'දිළිඳුකම පිටු දැකීමේ වර්ෂය' ලෙසින් නම් කර තිබෙනවා.

රටක් ලෙස අපි මේ අරමුණු, අභියෝග මැද වුවද ජයගතයුතු වෙනවා. එසේම ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අප ඉන්නේ අවදානම් තත්වයකයි. එක් අතකින් අපට ජයගත නොහැකි තත්වයට පත්ව ඇති කාලගුණ, දේශගුණ විපර්යාස ඊට හේතු වී තිබෙනවා. රටේ එක් අර්ධයක් අසාමාන්‍ය වර්ෂාව හේතුවෙන් ගංවතුර හා නායයෑම් තර්ජනවලට මුහුණ දුන්නා. තවත් අර්ධයක් අධික නියඟයෙන් පීඩා විඳිනවා. අපේ රට කෘෂිකර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයට හිමිකම් කියන රටක්. ආර්ථිකයේ වැඩි ප්‍රතිශතයක් රඳා පවතින්නේ කෘෂිකර්මාන්තය මතයි. නමුත් පවතින කාලගුණික, දේශගුණික විපර්යාස මත බීමට වතුර නොමැති වීම, නිවාස අහිමි වීම, ගොවිතැන් විනාශ වීම ආදි ගැටලු හරහා ග්‍රාමීය ආර්ථිකය කඩා වැටීමකට ලක් වී, එම ප්‍රදේශවල ජන ජීවිතය අඩාල වී තිබෙනවා.

එබැවින් මෙවැනි සමුළු හරහා කතිකා වන, සමාජගත වන දැනුම සහ තොරතුරු ජනතාවගේ ජීවන තත්වය ඉහළට ගෙන ඒමට යොදා ගත යුතුයි. ඒ සඳහා නිශ්චිත ක්‍රියාකාරී සැලසුමක් මත රාජ්‍ය ආයතන, විද්‍යාඥයන්, පර්යේෂකයන්, නවෝත්පාදකයන්, ව්‍යවසායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් එකට එකතු කොට අභියෝග අරමුණු කරගනිමින් තිරසර සංවර්ධනයක් කරා රට මෙහෙයවීමට වීමට අවශ්‍ය වන අමාත්‍යංශයේ වගකීම ඉටු කරනවා" යනුවෙන් පැවසීය.

දේශීය සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශ නියෝජනය කරමින් කීර්තිමත් විද්‍යාඥයන් සහ පර්යේෂකයන් විද්වතුන් සහභාගී වූ මේ සම්මන්ත්‍රණයේදී සෞඛ්‍ය විද්‍යාව, ස්වභාවික විද්‍යාව, භෞතික විද්‍යාව, කළමනාකරණ සහ මුදල්, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය යන විෂය පරාසයන් පිළිබඳව අවධානය යොමු කරමින් ඒ හා සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කෙරිණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග, උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය හේමන්ති රණසිංහ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය සුදන්ත ලියනගේ, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ පී. එම්. ධර්මතිලක මහත්ම මහත්මීහු දේශීය හා විදේශීය පර්යේෂකයන් විද්වතුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

**දුලිප් නයනප්‍රිය**
**මාධ්‍ය ඒකකය**
**විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

*01 වැනි පිටුවෙන්...*

### ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග...

ඒ යටතේ, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රමෝපායීකරණය සහ පාලන තන්ත්‍රයේ භූමිකාව , විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනය පිළිබඳ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රමෝපායීකරණය, STEM අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රමෝපායීකරණය යන මාතෘකා යටතේ වෙන් වෙන් වශයෙන් විද්වත් මණ්ඩල සාකච්ඡාවන් පැවැත්විණි.

රටක් වශයෙන් අප නිවැරදි සංවර්ධන මාවතක ගමන් කරනවාද යන්න මේ වන විට වැඩි වශයෙන් කතාබහට ලක් වන අතර මෙහිදී ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වීම රජයේ ඉලක්කය යි. එම ඉලක්ක ජය ගැනීමේ දී කෘෂිකාර්මික, ඛනිජ සම්පත් වැනි ස්වභාවික සම්පත්වලට අමතර අගයක් එකතු කිරීමෙන් එම සම්පත්වල වටිනාකම ඉහළ දැමීමට හැකියාව ලැබේ. එම අමතර අගයන් එකතු කිරීමට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන් ඵලදායී ලෙස යොදා ගතයුතුය. කාර්මික ක්ෂේත්‍රයේ දියුණුවට අදාළව සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ රාශියක් ද වේ. එසේම විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන්හි පෙරළියක් කළ හැකි ලෙස අනාගත පරම්පරාව නිර්මාණය කිරීමට රට තුළ STEM අධ්‍යාපනය ප්‍රචලිත කර නගාසිටුවීම ද කළ යුතුය. මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ශක්තිමත් ආර්ථික තත්වයක් නිර්මාණය කරගත හැකි ලෙස රජයේ ප්‍රතිපත්ති සකස් කරගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම සම්මන්ත්‍රණයේ අරමුණ විය. මේ සම්මන්ත්‍රණයට ජනාධිපතිතුමා ද සහභාගී වූ අතර,

මෙහිදී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් විෂයානුබද්ධ ගැටලු රැසක් ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද අතර, ඊට සවන් දුන් ජනාධිපතිතුමන් පිළිතුරු කතාවක් ද ඉදිරිපත් කරන ලදී.

විද්‍යා හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, රාජ්‍ය අමාත්‍යවරුන් වන එරාන් වික්‍රමරත්න, ලක්ෂ්මන් සෙනෙවිරත්න, මොහාන් ලාල් ග්‍රේරු , අමාත්‍යාංශයේ ලේකම් උදය ආර් සෙනෙවිරත්න, අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහත්වරුන්, දිවයිනේ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල නියෝජිතයන්, විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන විද්‍යාඥයන්, තාක්ෂණවේදීන්, වෘත්තිකයන් ඇතුළු විශාල පිරිසක් ද මේ අවස්ථාවට එක් වූහ.

### ශ්‍රී ලංකාව හා...

මෙය දෙපාර්ශ්වය අතර මෙය විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගතිය වෙනුවෙන් අත්සන් තබන ලද දෙවැනි සහයෝගීතා ගිවිසුමයි. සහයෝගීතා ගිවිසුමට අනුව ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සහ වැඩමුළු සඳහා ආහාර තාක්ෂණය, පැළෑටි ආශ්‍රිත වෛද්‍ය විද්‍යාව, මිනුම් විද්‍යාව, අභ්‍යවකාශ පර්යේෂණ හා යෙදවුම්, රොබෝ තාක්ෂණය සහ ස්වයංක්‍රියකරණය, කාර්මික ඉලෙක්ට්‍රෝන විද්‍යාව සහ ජාතික වශයෙන් වැදගත් වන වෙනත් විෂය පරාසයන් තේමා කරගත් ක්ෂෙත්‍රයන් යටතේ යෝජනා කැඳවන ලදී.

දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් වූ 100කට අධික යෝජනා පිළිබඳව දෙපාර්ශ්වයම විසින් සිදු කරනු ලැබූ පුළුල් ඇගයීම් ක්‍රියාවලියකින් අනතුරුව 2017 මැයි 29 දින ශ්‍රී ලංකාවේ දී පැවති ප්‍රථම ඉන්දු ශ්‍රී ලංකා පර්යේෂණ සමුළුවේ දී ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති 18ක් සහ ඒකාබද්ධ වැඩමුළු 2ක් වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීමට එකගතාව පළ කෙරිණි.

### නවෝත්පාදනයේ....

මේ තරඟාවලියේ දී තෝරාගනු ලබන විශිෂ්ටතම නිර්මාණ සහ නිර්මාණකරුවන් 'දසිස්' සම්මානයෙන් පිදුම් ලැබීමට ද නියමිතය.

ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ සංගමය මඟින් අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙත ශ්‍රී ලංකාවේ නව නිර්මාණකරුවන් දිරිගැන්වීමට කරන ලද දායකත්වය අගය කරමින් මෙහිදී විශේෂ සම්මානයක් ද පිරිනමන ලදී.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති මහාචාර්ය මොහාන්ද සිල්වා, ඉන්දියානු නවෝත්පාදකයන්ගේ සංගමයේ සභාපති ආචාර්ය ඒ. එස්. රාඕ, ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ සංගමයේ මහ ලේකම් එච්. මැන් ලී සහ එහි තරුණ කටයුතු අධ්‍යක්ෂ එරිචා ඉන්සාන්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් ආචාර්ය මහේෂ් එදිරිසිංහ යන මහත්ම මහත්මීන්, විද්වතුන්, නව නිර්මාණකරුවන් ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

සහල් යනු ශ්‍රී ලංකාව ඇතුළු ලොව ජනගහණයෙන් අඩක ගේ ප්‍රධාන ආහාරය යි. අප රටේ සහල් වගාව ක්‍රිස්තු පූර්ව 800 තරම් අතීතයකට දිව යයි. මේ කාලයේදී, අප රට 'පෙරදිග ධාන්‍යාගාරය' ලෙස හඳුන්වන ලද අතර දේශීය සහ පාරම්පරික සහල් වර්ග 2000කට ආසන්න ප්‍රමාණයක් පැවැති බවට වාර්ථා වී ඇත. මේ සහල් වර්ග විශාල විවිධත්වයකින් යුක්ත වූ අතර, එමනිසා ම ඒවාට විවිධ වූ සහල් වගා පරිසරවලට අනුගතවීමේ හැකියාව සහිත විය.



# පාරම්පරික සහලේ වැදගත්කම

# ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හෙළිකර ගනියි

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම සහ ජනප්‍රවාදයන්ට අනුව මේ සහල් වර්ගවලින් සමහරක් විවිධ වූ පෝෂණ ගුණාංගයන්ගෙන් සමන්විත වී ඇත. එම ගුණාංග අතර, ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම, කායික සහ ලිංගික ශක්තිය, සර්ප විෂ සඳහා ප්‍රතිකාර, ආහාර ජීර්ණය සහ බහිශ්‍රාවිය පහසු කරලීම, උණ, දියවැඩියාව, මළබද්ධය, මුත්‍රා රෝග, ස්ථූලභාවය සහ ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර වේ. අප රටේ පුරෝගාමී බහුවිධ පර්යේෂණ ආයතනයක් වන ITI, සාම්ප්‍රදායික සහල් වර්ග පිළිබඳ කිසිදු ආකාරයක පුළුල් අධ්‍යයනයක් නොවුන කාලයක එනම් 2006 මුල් භාගයේ දී ආහාර සහ ඖෂධීය තාක්ෂණ අංශය මගින් ආරම්භ කරන ලදී. ඒ අනුව සාම්ප්‍රදායික සහල් වර්ග පිළිබඳ දත්ත එකතුවක් වැඩිදියුණු කිරීමේ අරමුණින් මේ පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙහි ඖෂධීය ගුණයන් පුළුල්ව අධ්‍යයනය කළ අතර, මෙය මෙහෙයවූයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය වෛද්‍ය ජී.ඒ.එස් ප්‍රේමකුමාර මහතා විසිනි. පර්යේෂණ ක්‍රියාවන් සිදුකරනු ලැබුවේ, ආහාර තාක්ෂණ අංශයේ පර්යේෂණ විද්‍යාඥ වෛද්‍ය කාංචනා අබේසේකර මහත්මියයි.

දියවැඩියාවෙ හි ආහාර පාලනය, පිළිකා සහ ස්නායුගත රෝග, ලොවපුරා ඇති ප්‍රධාන බෝ නොවන රෝග NCD වළක්වාලීමට එහි ඇති උචිතභාවය මැනබැලීමට සාම්ප්‍රදායික සහල් වර්ග 25ක් පමණ අධ්‍යයනය කරන ලදී.





ආචාර්ය ජී.ඒ.එස් ප්‍රේමකුමාර (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ අධ්‍යක්ෂ ජනරාල්



ආචාර්ය කාංචනා අබේසේකර (පර්යේෂණ විද්‍යාඥ) කාර්මික තාක්ෂණ ආයතනය

## දියවැඩියාව වළකයි

දියවැඩියාව යනු නිදන්ගත රෝගයකි. ශ්‍රී ලංකාවේ මෑතක දී ලබාගත් සෞඛ්‍ය සංඛ්‍යා ලේඛනවලට අනුව අප රටේ ජනගහනයෙන් 1/4කට දියවැඩියාව හෝ පූර්ව දියවැඩියාව ඇත. දියවැඩියාව අල්ප මධුරක්ත ආහාර භාවිතය මගින් ඵලදායී ලෙස වළක්වා ගත හැකිය. තෝරාගත් සහල් වර්ගයන් ඒවායේ ඇල්ෆා ඇමිලේස් එන්සයිම මිනිස් ආහාර ජීර්ණ මාර්ගයේ ප්‍රධානම කාබෝහයිඩ්‍රේට් ජීර්ණ එන්සයිමය නිශේධන හැකියාව මැනබැලීමට අධ්‍යයනය කොට ඇත. ප්‍රථම වරට මේ අධ්‍යයනයේ සොයාගැනීම් ඉතා සිත්ගන්නා ප්‍රතිඵල පෙන්වමින් සුදු සහල් නිවුඩු තුළ අන්තර්ගත ඇල්ෆා ඇමිලේස් එන්සයිම නිශේධන ක්‍රියාකාරීත්වයට වඩා ඉතා වැඩි ක්‍රියාකාරීත්වයක් රතු සහල් නිවුඩු තුළ ඇති බවට සොයාගෙන ඇත. සුදු හීනටි, ගොඩ හීනටි, මසුරන් සහ දික් වී සාම්ප්‍රදායික රතු සහල් වර්ගයන් තුළ වැඩිම නිශේධන ක්‍රියාකාරීත්වයක් ඇති බවට සොයාගෙන ඇති අතර වර්ග 90කින් එන්සයිම ක්‍රියාකාරීත්වය නිශේධනය කිරීමට එම සහල් ප්‍රභේදවලට හැකිවී ඇත. දීර්ඝ කාලීන අධිමධුරක්ත තත්ත්වය (අධික රුධිරගත සීනි මට්ටම) මගින් දියවැඩියා රෝගීන්ට වකුගඩු ආබාධ, අක්ෂි ආබාධ, ස්නායු ආබාධ, ඇල්සයිමර් සහ පාකින්සන් රෝග සහ කන්තුක වාහිනී රෝග දරුණු දියවැඩියා සංකීර්ණතා ඇති කරයි. මේ අධ්‍යයනය මගින් තෝරාගත් සාම්ප්‍රදායික සහල් ප්‍රභේදවල නිවුඩු, ඒවායේ ප්‍රෝටීන ග්ලයිකේෂණ ප්‍රතික්‍රියා

නිශේධන හැකියාව මැනබැලීමට පරීක්ෂා සිදු කොට ඇත. එහි ප්‍රථිපල පෙන්වමින් සුදු සහල් සමග සංසන්දනාත්මකව රතු සහල් ප්‍රභේද ඉතා ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ අතර සුදු හීනටි, ගොඩ හීනටි, මසුරන්, සහ දික් වී ප්‍රභේද ඉහළ ම නිශේධන ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කොට ඇත. මේ අධ්‍යයනය තව දුරටත් පුළුල් කරමින් රතු සහල් නිවුඩු තුළ දැනටමත් අන්තර්ගත ප්‍රෝටීන් ග්ලයිකේෂන් ප්‍රතිවර්තනය කිරීමේ හැකියාව මැනබලා ඇත. ප්‍රතිඵල මගින් එම තෝරාගත් සහල් ප්‍රභේදවල දියවැඩියා සංකූලතා කළමනාකරණය සඳහා අත්‍යවශ්‍යම ජීව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වයන් ඇති බවට සොයාගෙන ඇත. ලෝකයේ ඕනෑම සහල් ප්‍රභේදයක මේ ප්‍රථිපල මගින්, දියවැඩියාව වළක්වාගැනීම සහ එහි ආහාර, හානිකර සංකූලතා කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාවේ නිවුඩු සහිත රතු සහල් ප්‍රභේද මිල දී ගැනීමේ වැදගත්කම පෙන්වාදෙන ලදී. මේ අධ්‍යයන ආකෘති භාවිතයෙන් ද සිදුකර ඇති අතර, එමගින් එහි ඇති රුධිරගත සීනි ප්‍රමාණය අවම කිරීමේ ගුණාංග නිරීක්ෂණය කොට ඇත.




## පිළිකාවට විසඳුමක්

එසේම පිළිකා යනු ලෝකයේ රෝගීබව සහ මරණයන්ට ප්‍රධාන හේතුවයි. ලොව සිදුවන මරණවලින් හතෙන් එකක් පිළිකා නිසා සිදුවන බවට වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ පිළිකා රෝගය ඉතා වේගයෙන් වැඩිවෙමින් පවතින අතර, තොල්, මුඛ කුහර සහ ග්‍රසනිකා, ශ්වාස නාල, අනු ශ්වාස නාල සහ පෙනහළු, අන්නසෝත්‍ර, පියයුරු, ගැබ්ගෙල, ඩිම්බ කෝෂ, මහාඅන්ත්‍ර සහ අධෝ මාර්ග පිළිකා බහුල වශයෙන් සොයාගෙන ඇත. මේ අධ්‍යයනයෙන් සුදු හීනටි, ගොඩ හීනටි, මසුරන් සහ දික් වී ප්‍රභේද මිනිස් පිළිකා සෛල පෙළක් (පෙනහළු, ගැබ්ගෙල, පියයුරු, මහා අන්ත්‍ර සහ රුධිර) සමග විනිශ්චය කොට ඇත. මේ අධ්‍යයනයන්ගේ ප්‍රතිපල මගින් මේ ප්‍රභේදවල, සියලුම පිළිකා සෛලවලට එරෙහිව වර්ධිත නිශේධන සහ ජීවි සෛලවලට ඇති වන විෂ සහිත බලපෑම් අවම කිරීමේ විභවය ඇති බවට සොයාගෙන ඇත.

තෝරාගත් සහල් ප්‍රභේදවලින් ස්නායුගත රෝගවලට ඇති බලපෑම එන්සයිම නිශේධන ක්‍රියාවලියට එරෙහිව විනිශ්චය කොට ඇත. එහිදී ස්නායුගත රෝග වළක්වා ගැනීම සහ ඇල්සයිමර්, පාකින්ස්න් වැනි රෝගවල ආහාර කළමනාකරණය සඳහා භාවිත කළ හැකි බව පෙන්නුම් කොට ඇත.

මේ අධ්‍යයනයේ සොයාගැනීම් තුළින්, රතු සහල් නිවුඩු තුළ, සුදු සහල් නිවුඩුවලට වඩා ඉහළ ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වයක් ඇති බවට පෙන්නුම් කොට ඇත. කළු හීනටි, කුරුලු තුඩ, පච්චපෙරුමාල් සහ මා වී වැනි සමහරක් රතු සහල් ප්‍රභේදවල නිවුඩු තුළ දක්නට ලැබුණු ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වය, කළු සහල්වලට වඩා ඉතා වැඩිය.

07 වැනි පිටුවට...







# ස්වභාවික තිරුවානාවලට සිලිකන් නිස්සාරණයෙන් අගය එකතු කිරීම


ශ්‍රී ලංකාවේ තිරුවානා

සිලිකන් ඔක්සිජන්වලට පසු පෘථිවි කබොලේ විශ්වයේ අට වැනි සුලභ මූලද්‍රව්‍ය සහ දෙවැනි සුලභතම ම මූලද්‍රව්‍යය (28% ස්කන්ධය) ලෙස සලකනු ලබයි. කෙසේ නමුත් එය පෘතුවි කබොලේ ශුද්ධ මූලද්‍රව්‍යයක් නොවන අතර අනෙකු වස්තූන්වල අඩංගු කොටසක් ලෙස පවතී. උදහරණ ලෙස වැලි , තිරුවානා, මැටි, ගිනිගල්, අමතේස්ත, අග්නි මාණික්‍ය, තලාතු මිතිරන්, පෙල්ස්පාර් ඛනිජ, රතු මැණික් වර්ග, තෝරමල්ලි, ඇස්බැස්ටස්, ගෝමේද, ගරුඬ පාෂාණ සහ පච්ච පඩියම් දැක්විය හැකියි.

වර්තමාන ලෝකයේ සිලිකන් සතුව බොහෝ භාවිතයන් සහ යෙදීම් පවතී. ඒවායින් ඉතාම ප්‍රකට සිලිකන් භාවිතයක් ඇත්තේ ඉලෙක්ට්‍රොනික් උපාංග තුළයි. අධි ශුද්ධ සිලිකන්, ට්‍රාන්සිස්ටර් තුළ අර්ධ සන්නායක ද්‍රව්‍යක් ලෙස සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපාංගවල සංරචකයන් ලෙස භාවිත වේ. වර්තමාන ලෝකයේ සිලිකන් මඟින් සූර්යකෝෂ, උදුකුරු සහ පරිගනක පරිපථ කොටස් නිපදවීමෙහිලා විශේෂ ස්ථානයක් ගනී. සූර්ය කෝෂයක් යනු සූර්යාලෝකය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කරන උපාංගයකි. උදුකුරුවක් යනු එක් ආකාරයක විද්‍යුත් ධාරාවක් (ප්‍රත්‍යාවර්ත AC), තවත් ආකාරයක විදුලි ධාරාවක් බවට පරිවර්තනය කරන විද්‍යුත් උපකරණයකි. සරළ ධාරාවක් (DC). ඉහත සඳහන් ප්‍රභව මඟින්

සිලිකන් නිස්සාරණය සහ ලබාගැනීම පහසු කාර්යක් නොවේ. එමෙන්ම එය ඉතා තීව්‍ර බල සහිත සංකීර්ණ ක්‍රියාවලියකි. සිලිකන් නිසස්සාරණය කළ හැකි ක්‍රම කිහිපයක් ඇත. මෙහිදී වඩාත් සුලභම සහ සාම්ප්‍රදායික ක්‍රමය වන්නේ සිලිකන් ඩයොක්සයිඩ් සමඟ කාබන් තාපනය කිරීමයි.

තිරුවානා යනු සිලිකන් අන්තර්ගත ඛණිජයක් වන අතර, සිලිකන් නිස්සාරණයට ප්‍රකට වූ ද්‍රව්‍යයකි. ශ්‍රී ලංකාව, අධි ශුද්ධ, ඉතා සිත්කළු තිරුවානා ප්‍රභේද (99+%, ශුද්ධ/ 100% ශුද්ධ තිරුවානා වැනි)වලින් පොහොසත් සහ ඒවාට ඉතා ප්‍රසිද්ධ වෙති.



සූර්ය බල පද්ධතිය

තිරුවානා හි රසායනික නාමය $SiO_2$ (සිලිකා) වන අතර, එය පෘතුවි කබොලේ ඉතා ප්‍රබල ඛනිජ විශේෂයන් අතුරින් එකක් ලෙස සැලකේ. සිලිකාවල ප්‍රධාන ම කොටස සිලිකා වැලිවලින් නිපදවූවත්, එහි ශුද්ධභාවය ශ්‍රී ලංකාවේ ස්වභාවික තිරුවානාවලින් ලබාගන්නා උසස් තත්ත්වය හා සම කළ නොහැකි වේ. එවැනි උසස් ගනයේ ශුද්ධ


සිලිකන් සූර්ය පැනලය


ශුද්ධ සිලිකන් / ලෝහ කුට්ටිය


සූර්ය ශක්ති ගොවිපළ




සිලිකන් සූර්ය කෝෂ

සහ ස්වභාවික සම්පත් ශ්‍රී ලංකාවේ පමණක් පැවතුණද, අවාසනාවන්ත කරුණ නම්, දේශීය තිරුවානා මෑතක් වනතුරු කිසිදු අගයන් එකතු කිරීමකින්



තොරව, අමිශ්‍ර ස්වරූපයෙන් ම අපනයනය කර තිබීමයි.

සිලිකන් ආදේශක, විශේෂයෙන් ම සූර්යකෝෂ සඳහා භාවිත කරන සිලිකන්, ඉතාම ශුද්ධ තත්ත්වයෙන් තිබිය යුතු වේ. කාර්මික තාක්ෂණ ආයතනයේ, ද්‍රව්‍ය තාක්ෂණ අංශය, මේ වන විට දේශීය තිරිවානාවලින්, අධි ශුද්ධ සිලිකන් නිස්සාරණය කිරීමට, කාර්යක්ෂම සහ පිරිවැය ඵලදායී ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම සුභවාදී අඩිතාලමකි.

06 වැනි පිටුවෙන්...

## පාරම්පරික සහලේ වැදගත්කම...

සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කෙරේ.

හයිපර්ලිපිඩීමියා, හෘදවාහිනී රෝගවලට සෘජුවම දායක වන ලෝකයේ පවතින පොදු සෞඛ්‍ය අභියෝගයකි. මේ සහල් ප්‍රභේදයන් තුළ පවතින, ලිපිඩ අවම කිරීමේ ගුණාංගය පරීක්ෂාවට ලක් කිරීමේ දී ඊට අවශ්‍ය ගුණාංග රාශියක් ඒ තුළ පවතින බවට සනාථ වී ඇත. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික රතු සහල් ප්‍රභේද වැනි එක ම ස්වභාවික නිෂ්පාදනයක් තුළ විවිධ වූ සෞඛ්‍යාත්මක ගුණාංග රාශියක් ඇතුළත් වීම, එහි ඇති නිදන්ගත රෝග කළමනාකරණය සඳහා විභව වූ චිකිත්සාමය අගයන් පෙන්නුම් කරයි.

තෝරාගත් සහල් ප්‍රභේදවල පෝෂණ සංයුතිය අධ්‍යයනයට ලක්කිරීමේ දී, ඒවා ආහාර තන්තු, ප්‍රෝටීන සහ ඛනිජ ලවණවලින් පොහොසත්ව ඇත. සාමාන්‍ය නිරෝගී ශ්‍රී ලාංකිකයෙක් දිනකට සහල් ග්‍රෑම් 275ක් පමණ පරිභෝජනය කරයි. උදාහරණයක් වශයෙන් දිනකට පච්චපෙරුමාල් සහල් ග්‍රෑම් 275 භාවිතයෙන් දිනක පෝෂණ අවශ්‍යතාවලින් ප්‍රෝටීන 66 (ග්‍රෑම් 275න් ග්‍රෑම් 35ක්) පිෂ්ඨය 25 (ග්‍රෑම් 275න් ග්‍රෑම්6.9) යකඩ 33 (ග්‍රෑම් 275න් මිලි ග්‍රෑම් 5.8) සැපයේ. එමනිසා අප රටේ සාම්ප්‍රදායික සහල් ප්‍රභේද, ජනතාවගේ පෝෂණ සහ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉතා අගනා ප්‍රධාන ආහාරයක් ලෙස සැලකිය හැකිවේ. මේ පර්යේෂණ මඟින් සාම්ප්‍රදායික සහල් ප්‍රභේදවලට සහ සහල් නිවුඩුවලට අගයක් එක් කරන ලදී. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් ප්‍රවර්ධනය කරමින්, එය ලංකාවේ ලාභ උපයන කර්මාන්තයක් බවට පත්කිරීමට ද එය ඉවහල් වී ඇත. එම නිසා අප, අපගේ නිධානයක් බඳු ස්වභාවිකව විකාශනය වන සාම්ප්‍රදායික සහල් ප්‍රභේද වගාව, අප රටේ ජනතාවගේ සෞඛ්‍යය සහ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීම සඳහා ආරක්ෂා කර ප්‍රවර්ධනය කරමු.

මෙම පර්යේෂණයට ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් මූල්‍යාධාර සැපයුන අතර සහල් සාම්පල ලබාදෙන ලද්දේ බෝම්බුවල සහ බතලගොඩ සහල් පර්යේෂණ ආයතන විසිනි.

04-05 පිටුවෙන්

## භෞතික විද්‍යාව හා...

ඉන්පසු යළි මෙය නවීකරණය වීමෙන් අනතුරුව 2015 දී නැවත පර්යේෂණ සඳහා යොදා ගැණිනි. එහි මුළු ශක්තිය ටෙරා වෝල්ට් 13 කි. ෂට්ටන උමං වටා ප්‍රතිවිරුද්ධ පැත්තක ගමන් කරන කදම්භයක් සහිත එකිනෙකට සමීප, සමාන්තර ආලෝක (කදම්භ නළ) දෙකක් ඇත.

මේ කදම්භ විරුද්ධ දිශාවට වළල්ලක් වටේට ගමන් කර ස්ථාන හතරක දී ඡේදනය වන පරිදි ඝට්ටනය වේ. එම ක්‍රියාකාරීත්වයට අධිචුම්භක බල උපයෝගී කරගනු ලැබේ. ටොන් 27ක් පමණ බර මේ චුම්භක 10,000 ක් පමණ මෙහි සවිකර තිබේ. මෙහි ඇතුළත පහළ උෂ්ණත්වයක් (-2710C) රඳවා ගැනීමට ද්‍රව හීලියම් යොදා ගැනේ.

දිනකට වරක් හෝ දෙවරක් ප්‍රෝටෝනයක් 6.5 GeV සිට 6.5TeV දක්වා ප්‍රවේගවත් කෙරේ. ඒ සඳහා චුම්භක බලය ටෙස්ලා 0.54 සිට ටෙස්ලා 7.7 ක් තෙක් වැඩි කළ යුතුය. තත්පරයකට වට 11,000ක වේගයකින් අංශු කදම්භ ගමන් කරයි. කදම්භ අඛණ්ඩ ලෙස නොව පොකුරු ලෙස මුදා හැරේ. එක් කදම්භයක ප්‍රෝටෝන බිලියන 115ක් ඇත. මේවායේ ගැටුම් සංඛ්‍යාතය මෙගා හර්ට්ස් 40කි.

පරම අභිලාශය වන්නේ විශ්වය තැනෙන මූලිකම කොටස සෙවීමයි. ලාර්ජ් හෙඩ්රෝන් කලයිඩරය මෑත භාගයේ දී ලෝකයේ විශාල වශයෙන් ප්‍රසිද්ධ විය. ඒ 'හිග්ස් බොසෝනය' නැමැති අංශුව ප්‍රතිනිර්මාණය වෙති. හිග්ස් බොසෝනය යනු අංශු භෞතික විද්‍යාව සම්මත ආකෘතියේ ප්‍රාථමික අංශුවකි.

1960 ගණන්වල දී මුලින්ම මේ පිළිබඳ සෛද්ධාන්තික අදහස් ප්‍රකාශ වූයේ එහි ඇති වැදගත්කම නිසාය. රික්තකයක දී ශුන්‍ය නොවන අගයක් හිග්ස් බොසෝනයට ඇත.

නිෂ්පාදනය හා හඳුනාගැනීමේ අසීරුව මත මේ පිළිබඳව ගැටලු මධ්‍යයේ නමුදු සර්න් හි විශාල හැඩ්රන් ඝට්ටකය හිග්ස් බොසෝනයන් සහ අනෙකුත් අංශු නිර්මාණය කිරීමේ උත්සාහයක යෙදුණි.

2012 ජූලි මස 4 වැනි දින, GeV/c2 125 ත් 127 ත් අතර ස්කන්ධයක් සහිත නව අංශුවක් සොයා ගැනිනි. භෞතික විද්‍යාඥයන් එය 'හිග්ස් බොසෝනය' යැයි සැක එළ කළ අතර, ෆර්මී පරිමාණයත් ප්ලාන්ක් පරිමාණයත් අතර කොටස පිළිබඳ සමීක්ෂණ කිරීමටත් මොවුන් බලාපොරොත්තු වේ. විවිධ පර්යේෂණ කණ්ඩායම් විවිධ ඉසවු ඔස්සේ ලාර්ජ් හෙඩ්රෝන් කලයිඩරය යොදාගනිමින් පර්යේෂණවල නිරත වන අතර මේ නිසා අප නොදත් බොහෝ දේවල් සොයාගැනීමට ඉදිරියේ දී හැකි වනු ඇත.

උපදේශකත්වය
උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
(විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය)

එච්. එම්. බී. සී. හේරත්
අතිරේක ලේකම්
(තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන)

නන්දනී සමරවික්‍රම
අතිරේක ලේකම් - (පාලන හා මූල්‍ය)

මෙහෙයවීම
පී. එම්. ධර්මතිලක
අධ්‍යක්ෂ - (විද්‍යා හා පර්යේෂණ සංවර්ධන)

හිමාලි ඩබ්. කේ. අතාවුදගේ
අධ්‍යක්ෂ - (තාක්ෂණ හා අන්තර්ජාතික සබඳතා)
නසීමා අහමඩ් - අධ්‍යක්ෂ (සැලසුම්)
නිමාලි කුලතුංග - අධ්‍යක්ෂ (සැලසුම්)
ඒ. කේ. පී. පීරිස් - ප්‍රධාන ගණකාධිකාරී

සම සංස්කරණය
මහේෂ් සමරසේකර - මාධ්‍ය ලේකම්
0112 - 372288
ධම්මිකා රත්නායක
මධුකා සුභාෂිණී අමරසිංහ
(තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන අංශය)

නිල ඡායාරූප
දුලිප් නයනප්‍රිය
අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය

LAKE HOUSE
Government Relations Dept.

සම්බන්ධීකරණය / සැලසුම් හා නිර්මාණ අධීක්ෂණය
සමන්ත කරුණාසේකර
කළමනාකරණ කර්තෘ - රාජ්‍ය සබඳතා
0112 429297 / 077 3493785

සම්බන්ධීකරණ කර්තෘ
ප්‍රමිතා රන්දලී පබසරා
සහාය සංස්කරණය
ඩබ්. ඒ. එස්. නිසංසලා කුමාරි
නිර්මාණ ශිල්පී
ධනුෂ්ක බණ්ඩාර/ අශානි ජයවර්ධන
ඩිජිටල් ඡායාරූප සැකසුම - නිෂ්පාදන ග්‍රැෆික් අංශය
මුද්‍රණය - ලේක්හවුස් වාණිජ මුද්‍රණ අංශය

**ජගත් විද්‍යා දිනය නොවැම්බර් 10**

# ජාතික විද්‍යා දින සැමරුම - 2017



ලෝක විද්‍යා දිනය යනු , 2001 වර්ෂයේ සිට සෑම වසරක ම නොවැම්බර් මස 10 වැනි දින ජාත්‍යන්තර මට්ටමින් සමරනු ලබන, සමාජය උදෙසා විද්‍යාවේ ඇති වැදගත්කම සහ සාමය සහ සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි දී විද්‍යාවට හිමිවන කාර්යභාරය යනාදිය ඉස්මතු කර පෙන්වනු පිණිස යොදගත් දිනයකි. නැගී එන ගැටලු සම්බන්ධව විද්‍යාත්මක විසඳුම් පිළිබඳ මහජන අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව ලෝක විද්‍යා දිනය සැමරීම හරහා ඉස්මතු කෙරේ. ‘සාමය සහ සංවර්ධනය උදෙසා විද්‍යාව’ තේමාව වටා රාජ්‍ය නිලධාරීන්, පාසල් සිසුන්, මාධ්‍යවේදීන් සහ මහජනතාව වශයෙන් සියලු පාර්ශ්වකරුවන් ඒකරාශී කිරීමේ අවස්ථාව විද්‍යා දින සැමරුම හරහා උදා වේ.

සමාජය සමග වඩා සමීපව සම්බන්ධවීම හරහා විද්‍යාවේ සංවර්ධනයන් පිළිබඳව පුරවැසියන් දැනුවත් වීම සහතික කිරීම ලෝක විද්‍යා දිනය ඔස්සේ අරමුණු කෙරේ. මිනිස් ක්‍රියාකාරකමින් වෙනස් වන පෘථිවිය තිරසරව පවත්වා ගැනීම සඳහා විද්‍යාඥයන්ට හිමිවන සුවිශේෂී භූමිකාව ද මේ හරහා අවධාරණය කෙරේ. 2015 වසරේදී, ලෝකයේ රටවල් විසින්, නව තිරසර සංවර්ධනය න්‍යායපත්‍රයක එක් කොටසක් ලෙස දිළිඳුභාවය අවම කිරීම සහ කාලගුණ විපර්යාස හා සම්බන්ධ ගැටලු අවම කිරීම අපේක්ෂා කෙරේ. එසේම මෙය සාමාන්‍ය ජනතාව, විශේෂයෙන් බාල පරපුර අතර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව දැනුම බෙදදීමට හැකිවීම, ගෝලීය තිරසරභාවය සහ දේශීය ක්‍රියාකාරීත්වයන් ඒකාබද්ධ කරනු පිණිස ලද සුවිශේෂී අවස්ථාවකි.

### ප්‍රථම ශ්‍රී ලාංකීය විද්‍යා දින සැමරුම

ශ්‍රී ලංකාව විසින් සිය ප්‍රථම ලෝක විද්‍යා දින සැමරුම “ සාමය සහ සංවර්ධනය උදෙසා විද්‍යාව” යන තේමාව යටතේ 2004 වසරේදී පවත්වන ලදී. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන ඔස්සේ, ලෝක විද්‍යා දිනය සමරනු පිණිස වාර්ෂිකව වැඩසටහන් ගණනාවක් පවත්වනු ලැබිණි. ඒ අනුව “සැමට විද්‍යාව” සහතික කිරීමේ ක්‍රියාවලියෙහි අඛණ්ඩ නියුතු වීම සඳහා මේ ජාතික වැදගත්කමකින් යුත් ක්‍රියාදමය ආයතනගත කිරීමේ අවශ්‍යතාවක් ද පවතී.

### ජාතික විද්‍යා දින සැමරුම - 2017

“ගෝලීය අවබෝධය සඳහා විද්‍යාව” “SCIENCE FOR GLOBAL UNDERTANDING” යන තේමාව යටතේ 2017 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දිනට යෙදෙන “ලෝක විද්‍යා දිනයට” සමගාමීව 2017 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකාවේ “ජාතික විද්‍යා දිනය” ලෙසත් එළැඹෙන සතිය “විද්‍යා සතිය” ලෙසත් නම් කර ඇත.

### අරමුණු

මෙසේ විද්‍යා දිනයක් සහ විද්‍යා සතියක් ප්‍රකාශයට පත්කිරීමේ මූලික අරමුණු අතර තිරසර සංවර්ධන ඉලක්කයන්ට අදාළ ව තිරසර සමාජයක් නිර්මාණයෙහිලා විද්‍යාවට හිමිවන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම, සමාජ යහපත උදෙසා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයේ භාවිතය සඳහා ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම හා දිළිඳුභාවය තුරන් කිරීමේ අරමුණින් විවිධ සමාජ තලයන් අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනයන් බෙදහදා ගැනීම සඳහන් කළ හැකිය.

### අර්ථාන්විත සැමරුමක්

මේ සම්බන්ධව 2017 නොවැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන විද්‍යා සතියට සමගාමීව විද්‍යා හා තාක්ෂණික දැනුම ප්‍රචලිත කිරීම සඳහා ප්‍රදර්ශන හා විද්‍යා පාගමන් ඇතුළු විවිධ වැඩසටහන් රැසක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා ඇත. 2017 වර්ෂයේ නොවැම්බර් මස 10 සහ 11 දිනයන් හි විද්‍යා දිනයට සමගාමීව ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනවල සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලැබේ.



ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ආයතනයට ආසන්නතම විශ්වවිද්‍යාලය හෝ වෙනත් පර්යේෂණ ආයතනයන්හි සහයෝගය ලබා ගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ කෙටි චිත්‍රපට, වීඩියෝ දර්ශන, සම්මන්ත්‍රණ හා විද්‍යා ප්‍රදර්ශන හරහා පාසල් සිසුන් හා මහනජතාව දැනුවත් කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තාක්ෂණ නිලධාරීන් හරහා කටයුතු කිරීමට නියමිතය.

එසේම, ප්‍රායෝගික හා න්‍යායාත්මක විද්‍යා හා තාක්ෂණ දැනුම පාසල් මට්ටමින් ප්‍රවර්ධනය, නව නිපැයුම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය හා පාසල් මට්ටමින් දිරිගැන්වීම සහ අලුත් වන විද්‍යා හා තාක්ෂණික දැනුම පාසල් මට්ටමින් ව්‍යාප්ත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය වශයෙන් පාසල් තෝරා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් වශයෙන් දිස්ත්‍රික් නියෝජනය කරමින් පත් කර ඇති විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්, පාසල් සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, ස්වෙච්ඡා සංවිධාන හා මහජනතාව අතර මනා සම්බන්ධතාවකින් යුතුව සිදු කිරීමට නියමිතය.

> **“ගෝලීය අවබෝධය සඳහා විද්‍යාව” “SCIENCE FOR GLOBAL UNDERTANDING” යන තේමාව යටතේ 2017 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දිනට යෙදෙන “ලෝක විද්‍යා දිනයට” සමගාමීව 2017 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකාවේ “ජාතික විද්‍යා දිනය” ලෙසත් එළැඹෙන සතිය “විද්‍යා සතිය” ලෙසත් නම් කර ඇත.**





වෂී 2017 ක් වූ ඔක්තෝබර් මස 25 වැනිදු බදුදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.